රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 23/2014

මගේ අංකය : EST-7/LEAVE/03/3143
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07

2014.10.07

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## ආයතන සංග්‍රහයේ XII පරිච්ඡේදයේ 14 වන වගන්තිය සංශෝධනය කිරීම.

ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 14 වගන්තිය කෙරෙහි ඔබේ අවධානය යොමු කරවමි.

02. සේවා ව්‍යවස්ථා හෝ බඳවා ගැනීම් පටිපාටි විධිවිධාන අනුව ශ්‍රේණි උසස්වීම් ලබා ගැනීම සඳහා පශ්චාත් උපාධි පාඨමාලා හදාරන රජයේ නිලධරයන්ට විභාගවලට පෙනී සිටීම සඳහා වැටුප් සහිත අධ්‍යයන නිවාඩු (දේශීය) ලබාදීමට 2014.07.03 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත.

03. ඒ අනුව ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 14 වගන්තියට 14:7 හා 14:7:1 යනුවෙන් පහත උප වගන්ති ඇතුළත් කරමින් සංශෝධනය කරනු ලැබේ.

14:7 යම් තනතුරකට අදාළ සේවා ව්‍යවස්ථාවේ හෝ බඳවා ගැනීම් පටිපාටියේ හෝ විධිවිධාන අනුව පශ්චාත් උපාධියක් හෝ ඊට ඉහළ උපාධියක් සම්පූර්ණ කළ යුතු අවස්ථාවලදී එකී උපාධි පාඨමාලා සඳහා අධ්‍යයන නිවාඩු ලබා නොගන්නා නිලධරයන්ට ඔවුන්ගේ කැමැත්ත පරිදි එම පාඨමාලාවේ විභාගවලට සූදානම් වීම සඳහා පමණක් කඩින් කඩ හෝ එක දිගට හෝ වැඩකරන දින 10ක උපරිමයකට යටත්ව වැටුප් සහිත අධ්‍යයන නිවාඩු ලබා දිය හැකි ය.

14:7:1 නිලධරයකු සම්බන්ධයෙන් මෙම අධ්‍යයන නිවාඩු ලබාදීම සේවා ව්‍යවස්ථාවේ/ බඳවා ගැනීමේ පටිපාටියේ වෙනස් ආකාරයකින් සඳහන් නොවන්නේ නම් එක් (01) අවස්ථාවකට පමණක් සීමා වියයුතු අතර, විභාගය අසමත්වීම හෝ විභාගය සඳහා පෙනී සිටීමට නොහැකි වීම හෝ වැනි හේතු මත නැවත වරක් ඉහත වගන්තිය යටතේ වැටුප් සහිත අධ්‍යයන නිවාඩු ලබා නොදිය යුතු ය.

04. තවද 1985.11.18 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 312 මෙයින් අවලංගු කෙරේ.

පී.බී. අබේකෝන්
ලේකම්
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය